සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය- 06 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 06 - 2023**

# භූගෝල විද්‍යාව

**කාලය පැය 02 යි**

නම / විභාග අංකයඃ .............................................................................................................

උපදෙස්: I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. II කොටසට වෙනම කොළයක පිළිතුරු සපයන්න. II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.

## I කොටස

➢ ප්‍රශ්න 1 සිට 5 දක්වා ප්‍රශ්න වල නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) පරිපාලන කොට්ඨාස ධූරාවලිය අනුව පාසලට පසුව හමුවනුයේ, ..........................................යි.
( දිස්ත්‍රික්කය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය)

02) දකුණු දිශාව හා නැගෙන දිශාව අතර පිහිටි අනු දිශාව වන්නේ ........................ යි.
(ගිණිකොන, ඊසාන, වයඹ)

03) කාලගුණික අංගයන්ගේ දිගුකාලීන සාමාන්‍ය තත්ත්වය .......................................... ලෙස හැදින්වේ. (උෂ්ණත්වය, දේශගුණය, කාලගුණය)

04) පිළිමතලාව ප්‍රදේශය .................................. නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
(පිත්තල භාණ්ඩ, පැදුරු, වෙස්මුහුණු)

05) මහනුවර නගරය ............................................. පිහිටීම නිසා වැදගත් කමක් උසුලයි.
(දළදා මාලිගාව , සානුවක, පැරණි රාජධානියක)

➢ 6 සිට 10 දක්වා ප්‍රශ්න වල හිස්තැන් සඳහා ගැළපෙන වචන යොදා හිස්තැන් පුරවන්න.

06) මධ්‍යම පාළාත මාතලේ, මහනුවර හා ........................ යන දිස්ත්‍රික්ක වලින් සමන්විතය.

07) ශ්‍රී ලංකාවේ පළමු අධිවේගී මාර්ගය වනුයේ, ................................................මාර්ගයයි.

08) ලෝකයේ විශාලතම දූපත ලෙස සැළකෙන්නේ, .......................................... යි.

09) ජලවාෂ්ප ඝණීභවණය වීමෙන් පසු කඩාහැලීම ................................ ලෙස හැදින්වේ.

10) වඩාත් කාර්යක්ෂම විදුලි පහන් වර්ගය වනුයේ ................................................... ය.

➢ පහත වාක්‍ය හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11) විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස නිවසේදී ජීව වායුව සකසා ගත හැකිය. (......)

12) සිතියමක් හෝ සැලැස්මක් ඇඳීමේ දී දිශාව දැක්වීම ඉතා වැදගත්ය. (......)

13) වායු දූෂණය නිසා වකුගඩු අබාධ ඇති වේ. (......)

14) පීඩනය මනිනු ලබන්නේ මිලිබාර් නම් ඒකකයෙනි. (......)

15) භූමිය පරිහරණයේ දී ඛණිජ සම්පත් ලබා ගැනීමට හැකිවීම විශේෂ වාසියකි. (......)

➢ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි බංගදෙනිය ප්‍රසිද්ධියක් උසුලන්නේ,

1. පිත්තල භාණ්ඩ සඳහාය.    2. උළු ගඩොල් සඳහාය.
3. පැදුරු සඳහාය.    4. වෙස්මුහුණු සඳහාය.

17) රජය මැදිහත් වී නොමිලයේ ලබා දෙන සේවාවක් වනුයේ,

1. තැපැල් සේවය  2. ප්‍රවාහන සේවය  3. සන්නිවේදන සේවය  4. අධ්‍යාපන සේවය

18) හිරු පායන දිශාවට මුහුණ ලා සිටගත් විට අපගේ වම් අත පිහිටන්නේ කවර දිශාවටද?

1. උතුරු  2. දකුණු  3. නැගෙනහිර  4. බස්නාහිර

19) වැඩිම දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් සහිත පළාත වනුයේ කුමක්ද?


1. නැගෙනහිර පළාත  2. මධ්‍යම පළාත  3. සබරගමුව පළාත  4. උතුරු පළාත

20) ශ්‍රී ලංකාවේ පහත ජන වර්ග අතරින් අඩු ජන සංඛ්‍යාවක් වාසය කරනුයේ කුමන ජන වර්ගයද?

1. සිංහල  2. ශ්‍රී ලංකා දෙමළ  3. ඉන්දීය දෙමළ  4. මුස්ලිම්

## II කොටස

**01)** අ) ඉදිරියේ දැක්වෙන ශ්‍රී ලංකාවේ පිහිටීම දැක්වෙන ආකෘති සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. අංක 1 න් දක්වා ඇති මුහුද කුමක්ද? (ල.2)

ii. අංක 2 න් දක්වා ඇති බොක්ක නම් කරන්න . (ල.2)

iii. අංක 3 න් දැක්වෙන සමුද්‍ර සන්ධිය කුමක්ද? . (ල.2)

iv. අංක 4 න් දැක්වෙන රට කුමක්ද? (ල.2)

ආ) i. ශ්‍රී ලංකාව අයත් වන මහද්වීපය කුමක්ද? (ල.2)

ii. ශ්‍රී ලංකාව පිහිටා ඇති සාගරය කුමක්ද? (ල. 2)

iii. අප්‍රිකා මහද්වීපය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවට කවර දිශාවෙන්ද? (ල.2)

iv. ශ්‍රී ලංකාවවේ පිහිටීම මෙරට සංස්කෘතියට බලපා ඇති ආකාරය කරුණු දෙකකින් දක්වන්න. (ල.2)

**02)** i. අපද්‍රව්‍ය ජනනය වන මූලාශ්‍ර 3 ක් දක්වන්න. (ල.3)

ii. අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකි ක්‍රම තුන නම් කරන්න. (ල.3)

iii. (අ) අපද්‍රව්‍ය බැහැර කිරීමට භාවිතා කරන නිල් හා තැඹිලි වර්ණ භාජන වලට බැහැර කරන අපද්‍රව්‍ය වර්ග දෙක පිළිවෙළින් දක්වන්න. (ල. 2)

(ආ) කසල වලින් ලබාගත හැකි ප්‍රයෝජන තුනක් පෙන්වා දෙන්න. (ල.3)

**03)** i. ජලයෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 3 ක් දක්වන්න. (ල.3)

ii. ජලය දූෂණය වන ආකාර දෙකක් දක්වන්න. (4)

iii. පහත වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කර පිළිතුරු සපයන්න.(4)

| ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටලු | ජලය තිරසාරව පවත්වා ගැනීමට ගතහැකි පියවර |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |


**04)** පහත රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ජල චක්‍රයේ ප්‍රධාන අවස්ථා 4 නම් කරන්න. (4)

ii. රූපයේ X, Y, Z වලින් දැක්වෙන කාලගුණය මනින උපකරණ නම් කරන්න. (3)

iii. කලගුණික තොරතුරු වැදගත් වන ක්ෂේත්‍ර 4 ක් දක්වන්න . (4)

X Y Z




**05)** i. පරාගනයට දායක වන සත්වයින් දෙදෙනෙකු නම් කරන්න. (ල.2)

ii. රෝග බෝවීමට දායක වන සත්වයින් දෙදෙනෙකු නම් කරන්න. (ල2).

iii. (අ) ශාක වලින් සතුන්ට ඇති ප්‍රයෝජන තුනක් දක්වන්න. (ල.3)

(ආ) පහත සතුන්ගෙන් ඇති ප්‍රයෝජන එක බැගින් සඳහන් කරන්න. (ල.4)

1. ඇටි කුකුලා 2. බත්කූරා 3. ගැඩවිල් පණුවා 4. වවුලා

(4) www.PastPapers.Wiki (3)



Download Term Test Papers, Short Notes From One Place!

06) i. පහත වගුව පිටපත් කර, දී ඇති තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න. (ල.4)

( වැව්, ගංගා, කුඹුරු, මාර්ග, වනාන්තර, පාෂාණ, ගෙවතු, විල්

| ස්වාභාවික ලක්ෂණ | මිනිසා විසින් නිර්මිත ලක්ෂණ |
|---|---|
| | |
| | |
| | |
| | |

ii. නිවසක භාවිතා වන බලශක්ති ප්‍රභවයන් හතරක් දක්වන්න. (ල.2)

iii. (අ) බල ශක්ති ඉල්ලුම ඉහල යාමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල.2)

(ආ) බලශක්ති නාස්තිය අවම කිරීමට භාවිතා කළ හැකි ක්‍රමවේද තුනක් දක්වන්න. (ල.3)

07) පහත දිස්ත්‍රික් සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. (අ) A අක්ෂරයන් දැක්වෙන වරාය කුමක්ද? (ල. 1)

(ආ) එම වරාය ආශ්‍රිත ප්‍රදේශයේ වැදගත්කම් දෙකක් දක්වන්න. (ල.2)

ii. (අ) B අක්ෂරයෙන් දැක්වෙන නගරය කුමක්ද? (ල.1)


(ආ) එම නගරයේ වැදගත්කම් දෙකක් ලියන්න. (ල.2)

iii. (අ) C අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක්ද? (ල.1)

(ආ) එම දිස්ත්‍රික්කයේ වැදගත්තම් දෙකක් ලියන්න. (ල.2)

iv. ඡේයා කර ඇති පළාත නම් කරන්න. (ල.1)

v. E අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක්ද? (ල. 1)




(4) WWW.PastPapers.WiKi (4)



Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය- 06 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 06 - 2023

# භූගෝල විද්‍යාව

පිළිතුරු පත්‍රය

## 1 කොටස

01) ග්‍රාම නිලධාරී කොට්ඨාසය 02) ගිණිකොන 03) දේශගුණය 04) පිත්තල භාණ්ඩ
05) දළදා මාලිගාව 06) නුවරඑළිය 07) කටුනායක - කොළඹ 08) ග්‍රීන්ලන්තයයි.
09) වර්ෂාපතනය 10) පෝක් සමුද්‍ර සන්ධිය මගිනි.

11) ✓ 12) ✓ 13) × 14) ✓ 15) ✓ 16) 2 17) 4 18) 1 19) 4 20) 3

## 11 කොටස

01) අ) i. අරාබි මුහුද ii. බෙන්ගාල බොක්ක iii. පෝක් සමුද්‍ර සන්ධිය iv. ඉන්දියාව
ආ) i. ආසියා ii. ඉන්දියන් iii. බටහිර iv. ඉන්දියාව අරාබිය වැනි රටවලින් විවිධ ජන කණ්ඩායම් සංක්‍රමණය වීම නිසා විවිධ ආගම්, භාෂා ව්‍යාප්තවීම, බටහිර ජාතීන්ගේ පැමිණීම සමඟ විවිධ සංස්කෘතීන් මිශ්‍රවීම

02) i. ගෘහස්ථ අපද්‍රව්‍ය, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, කාර්මික අපද්‍රව්‍ය
ii. භාවිතය අවම කිරීම, නැවත භාවිතා කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම ($3_R$)
iii. අ) කඩදාසි, කාඩ්බෝඩ් වැනි (දිරාපත් වන), ප්ලාස්ටික්, පොලිතීන් (දිරාපත් නොවන) ආ) කොම්පෝස්ට් නිෂ්පාදනය, ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම, විවිධ නිෂ්පාදන සිදු කිරීම ආදී

03) i. ගෘහස්ත කටයුතු, විදුලි බල උත්පාදනයට, කෘෂිකර්මාන්තයට ආදී ...
ii. කෘෂිකර්මාන්තයේ දී භාවිතා කරන කෘෂි රසායන ජල මූලාශ්‍ර වලට එකතු වීම, කර්මාන්ත වලින් ඉවල ලන අපද්‍රව්‍ය ජලයට මිශ්‍ර වීම, වාහන සේදීමේ දී ඈදී ...
iii.

| ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටලු | ජලය තිරසාරව පවත්වා ගැනීමට ගතහැකි පියවර |
|---|---|
| 1. පානයට ජලය නොමැතිවීම | 1. ජලය අපතේ යාම වැළැක්වීම |
| 2. කෘෂිකාර්මික කටයුතු අඩාලවීම | 2. ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම |
| 3. ජල විදුලිබල උත්පාදනය බිඳ වැටීම | 3. ජල දූෂණය වැළැක්වීම ආදී ..... |

04) i. වාෂ්පීකරණ උත්ස්වේදනය, ඝනීභවනය, වර්ෂණය, මතුපිට ගලායාම
ii. X - උෂ්ණත්වමානය, Y - වර්ෂාමානය, Z - අනිලමානය
iii. ධීවර කර්මාන්තය සඳහා, ගුවන් ගමන් සඳහා, නාවික කටයුතු සඳහා, කෘෂිකාර්මික කටයුතු සඳහා ආදී ...

(2) WWW.PastPapers.WiKi (1)

Download Term Test Papers, Short Notes From One Place!

05) i. මීමැස්සා, සමනලයා ii. මීයා, මදුරුවා iii. අ) ඖෂධ ලබා ගැනීම, විවිධ ආහාර වර්ග සපයා ගැනීම, දැව ලබා ගැනීම ආදී ...... ආ)
ඇටිකුකුලා - ගොලුබෙල්ලන් වැනි බෝග වලට හානි කරන සතුන් කා දැමීම.
බත්කූරා - වගාවන්ට එන කෘමි සතුන් කා දැමීම
ගැඩවිල් පනුවා - පස පෝෂණය කිරීම
වවුලා - බීජ ව්‍යාප්ත කිරීම

06) i.

| ස්වාභාවික ලක්ෂණ | මිනිසා විසින් නිර්මිත ලක්ෂණ |
|---|---|
| ගංගා | වැව් |
| වනාන්තර | කුඹුරු |
| පාෂාණ | මාර්ග |
| විල් | ගෙවතු |

ii. දර, ගෑස්, විදුලිය, ජීව වායුව ආදී
iii. අ) ජනගහන වර්ධනය, විද්‍යුත් උපකරණ බහුලවීම, කාර්යබහුලතාවය ආදී
ආ) කාර්යක්ෂම උපකරණ භාවිතය, අපතේ නොයැවීම, අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම ආදී .....

07) i. අ) A ත්‍රිකුණාමල වරාය
ආ) පුළුල් ස්වාභාවික වරාය, කෝනේෂ්වරම් කෝවිල පිහිටීම, උණුවතුර ළිං ආදී

ii. අ) B ගාල්ල නගරය

ආ) ප්‍රදීපාගරය පිහිටීම, ලන්දේසි බලකොටුව පිහිටීම ආදී...

iii. අ) කොළඹ

ආ) පරිපාලන අගනගරය පිහිටීම, වෙළඳ අග නගරය පිහිටීම, ප්‍රධාන ජාත්‍යන්තර වරාය පිහිටීම ආදී .... iv. ඌව පළාත v. පොළොන්නරුව

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න